**Sinhala translation**

## කැනඩා දිනය නිමිත්තෙන් කැනඩාවේ මහ කොමසාරිස්තුමන්ගේ පණිවිඩය

*කොළඹ, ජූලි 1, 2023*

සුභ කැනඩා දිනයක් වේවා!  ශ්‍රී ලංකාව හ මාලදිවයින යන රටවල මහ කොමසාරිස්වරයා වශයෙන්, මෙම කලාපයේ සේවය කරන, සංචාරය නිරත හෝ පදිංචිව සිටින සියලුම කැනේඩියානුවන්හට සහ මිතුරන්හට මගේ උණුසුම් සුබ පැතුම් පිරිනැමීමට ලැබීම ගැන මම ඉමහත් සතුටට පත් වෙමි. රමණීය භූ ලක්ෂණ වලින් සපිරි, බහු සංස්කෘතිකත්වය හා බහුවිධභාවය තුල එකමුතු බව ගරුකරනු ලබන - සියලු දෙනා ඇතුළත් වීමේ සහ ප්‍රගතියේ ආලෝකයක් ලෙස නැගී සිටින විචිත්‍රවත් සමාජයක කැඩපත බඳු කැනඩා සම්මේලනයේ 156 වන සංවත්සරය යෙදෙන මෙම විශේෂ දිනයේදී ලොව පුරා වෙසෙන කැනේඩියානුවන්ගේ සිතුවිලි තම දේශය වෙත යොමුවේ. අද, අපි කැනේඩියානු ජනතාවගේ කැපී පෙනෙන ජයග්‍රහණ සහ දායකත්වය සමරන අතර, ලොව පුරා බොහෝ දෙනෙකුට කැනඩාව ආශ්වාදයක් බවට පත් කර ඇති වටිනාකම් ගැන මෙනෙහි කරන්නෙමු.

දෙසැම්බර් මාසයේදී මා මෙරටට පැමිණි දා පටන්, සිය වැඩිදුර අධ්‍යාපන කටයුතු සඳහා හෝ පවුල් හෝ ඥාතීන් බැලීම සඳහා හෝ පදිංචිය සඳහා  කැනඩාවට සංක්‍රමණය වූ ශ්‍රී ලංකාවේ වෙසෙන සියලු ප්‍රජාවන්ට අයත් ශ්‍රී ලාංකිකයින් මා හට මුණගැසී ඇත. අප දෙරට අතර මිත්‍රත්වය බෙහෙවින් ගැඹුරට දිවෙන අතර මාගේ මාතෘ භූමිය සමග දැඩි සම්බන්ධතාවයන් සහිත මිතුරන් අතර සිට අපගේ ජාතික දිනය සැමරීමට ලැබීම පිළිබඳව මා අතිශය සතුටට පත්වෙමි. දශක ගණනාවක් තිස්සේ කැනඩාව ශ්‍රී ලංකාවේ ප්‍රබල පාර්ශවකරුවකු ලෙස කටයුතු කොට ඇති අතර කැනඩා මිත්‍රත්ව මාර්ගය අපගේ එම දිගු හවුල්කාරීත්වය පිළිබිඹු කෙරෙන එක් නිදසුනකි.  මා හට මෑත මාස කිහිපය තුළ මාලදිවයිනේ දෙවරක් සංචාරය කිරීමට හැකි වූ අතර අපගේ වර්ධනය වන සහයෝගීතාවය නිරීක්ෂණය කිරීමට ලැබීම සතුටට කරුණකි. මාලදිවයිනේ දූපත් අතර සම්බන්ධතාවයට කැනේඩියානු මුහුදු ගුවන් යානා දායක වන ආකාරය දැකීම සතුටුදායක කරුණක් විය.

මාගේ ධූරයේ රාජකාරි ආරම්භ කරන ලද්දේ ශ්‍රී ලංකාව මින් පෙර කිසි දිනෙක අත් නොවිඳ තිබූ බරපතල ආර්ථික අර්බුදයක් මද්යෙය් බව මා හෙඳින් දනිමි. එම ආර්ථික අර්බුදයෙන් වඩාත්ම දරුණු ලෙස පීඩාවට පත් පුද්ගලයින් හට සහනයක් ගෙන ඒම සඳහා කැනඩාව දායක වූ අතර ශ්‍රී ලාංකිකයන්ගේ ආර්ථික පුනර්ජීවන ක්‍රියාවලියේදී ඊට අවශ්‍ය කරනු ලබන සහාය අඛන්ඩව ලබා දීමට කැනඩාව සූදානමින් සිටින බව මා මෙහිදී ප්‍රකාශ කරන්නෙමි. එමෙන්ම, ශ්‍රී ලංකාවට මෙම අරුබුදයෙන් මිදී වඩාත් අන්තර්කරණය වූ සහ සෞභාග්‍යමත් රටක් ලෙස නැගී සිටීමටත් එහි සැබෑ විභවතාවයන් සාක්ෂාත් කොට ගනිමින් ශක්තිමත් ලෙස අනාගතයට මුහුණ දීමටත් අවශ්‍ය වන්නාවූ අව්යාජ වෙනස ඇතිකරගැනීමට මෙය මහඟු අවස්ථාවක් ලෙස අප පිලිගන්නෙමු. කැනඩාව තමන්ගේම දුශ්කර අතීතය සමගින් තවමත් අරගලයේ යෙදෙමින් ආදිවාසී ජනතාවගේ දිගු කාලීන ගැටලු විසඳීම සඳහා ඔවුන් සමග එක්ව කටයුතු කරන මේ අවස්ථාවේදී අර්ථවත් සහ දිගු

කාලීන ප්‍රතිසන්ධානයක් වෙනුවෙන් වන ශ්‍රී ලංකාවේ ව්‍යායාමයන්ට සහාය දැක්වීම සඳහා අපගේ අත්දැකීම් බෙදාහදා ගැනීමට අප සූදානමින් පසුවන්නෙමු.

ඉදිරි දැක්ම සඳහා පෙනීයන කරුණක් වන්නේ අප දෙරටටම අපගේ අවධානය යොමු කිරීමට නව සහ දිගු කාලීන ප්‍රමුඛතාවන් ඇති බවයි. 2022 වර්ෂයේදී, කැනඩාව විසින් සිය ඉන්දු-ශාන්තිකර මූලෝපාය දියත් කරන ලදී. එය කැනඩාවේ ජාත්‍යන්තර සහයෝගිතාවන් සහ සම්බන්දතා ශක්තිමත් කර ගැනීමට මෙන්ම කලාපයේ සෙසු රටවල් සමග සහයෝගීතාවය වර්ධනය කර ගැනීම සඳහා හේතු කාරණා වේ. සාමය, ඔරොත්තුදීමේ හැකියාව සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම මෙන්ම තිරසර හා හරිත අනාගතයක් ගොඩනැගීම අපගේ ප්‍රමුඛතාවයන් අතර වේ. ලොවේ පානීය ජල සැපයුමෙන් 20% ක් සපයනු ලබන සහ ලොව දිගම සාගර වෙරල තීරය සහිත රට ලෙස වටිනා සාගර ජෛව පද්ධති ආරක්ෂා කිරීම ඇතුලු වගකිවයුතු පාරිසරික මාර්ගෝපදේශකත්වයේ වටිනාකම කැනඩාව විසින් ඉතා හොඳින් වටහා ගෙන සිටී. දේශගුණික විපර්යාසයන් හමුවේ වඩාත් අභියෝගකාරී තත්වයන්ට මුහුණ දී සිටින ශ්‍රී ලංකාව මෙන්ම මාලදිවයිනද මේ සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් දක්වන බව මා දනිමි. අප දෙරට විසින්ම මුහුණ දී ඇති ගැටලු වඩාත් යහපත් ලෙස විසඳා ගැනීම සඳහා මෙම කරුණු මෙන්ම වෙනත් දෑ සම්බන්ධයෙන්ද අප දෙරට අතර අඛන්ඩ සහයෝගීතාවය සහ කථිකාවන් ඉදිරියේදී වඩාත් ශක්තිමත් වේවායි මා ප්‍රාර්ථනා කරමි.

මෙම කැනඩා දිනයේදී ශ්‍රී ලංකාව සහ මාලදිවයින තුල වෙසෙන කැනේඩියානුවනට හට අපගේ බහුසංස්කෘතික සහ බහුවිද රට අභිමානයෙන් යුතුව සැමරීමට හැකිවේවායි මා ප්‍රාර්ථනා කරමි.

සියලු දෙනා හට සුභ කැනඩා දිනයක් වේවා !

එරික් වොල්ශ්

ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ කැනේඩියානු මහ කොමසාරිස්